# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2050/48 – 2017 දෙසැම්බර් 22 වැනි සිකුරාදා – 2017.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුත්තලම් පත්තුව සුළු කොට්ඨාසයේ, නල්ලන්දලුව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පු/මන්/2011/508 හා 2011.12.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'අ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1685 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'අ' – නල්ලන්දලුව ජුම්මා පල්ලිය ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.1685

උතුරට: අබ්දුල් රසීර් මසූදා සහ අබ්දුල් රසීර් අස්මීර් හිමිකම් කියන නල්ලන්දලුව ජුම්මා පල්ලිය ඉඩම; නැගෙනහිරට: නල්ලන්දලුව ජුම්මා පල්ලිය හිමිකම් කියන නල්ලන්දලුව ජුම්මා පල්ලිය ඉඩම; දකුණට: නල්ලන්දලුව ජුම්මා පල්ලිය හිමිකම් කියන නල්ලන්දලුව ජුම්මා පල්ලිය ඉඩම; බටහිරට: මාර්ගය(ප්‍රාදේශීය සභා).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2011/ජීසී/185.
2017 නොවැම්බර් මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1A – G26158 – 17 (2017/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*